සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2020

**09 ශ්‍රේණිය**

**පුරවැසි අධ්‍යාපනය**

කාලය පැය දෙකකි

I කොටස

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න
- **අංක 1 සිට 15 තෙක් ප්‍රශ්නවල දී ඇති (1),(2),(3),(4) පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුර තෝරා එහි අංකය ඉදිරියෙන් ඇති වරහන තුල ලියන්න**

(01) ආණ්ඩුවක මූලික වගකීම වන්නේ, රාජ්‍යය තුළ

(1) නීති කඩ කල විට දඬුවම් පැමිණ වීමයි (2) නීතිය හා සාමය ආරක්ෂා කිරීමයි

(3) යුක්තිය හා සාධාරණත්වය ඇති කිරීමයි (4) නීතිය පිළිබඳව ජනතාව දැනුම්වත් කිරීමයි (........)

(02) සමාජය යනුවෙන් අදහස් කරනුයේ කුමක් ද?

(1) පුද්ගල හා සංවිධාන සමූහයක එකතුවයි (2) ආගමික ආයතන සියල්ලෙහිම එකතුවයි

(3) පුද්ගල කණ්ඩායම් අතර පවතින සබඳතාවයි (4) පාසල් පද්ධතිය සංවිධානය වී ඇති ආකාරයයි (........)

(03) ළමා හිංසනය හා අපචාර පිළිබඳ දැනුම්වත් කිරීමේ සෘජු දුරකථන අංකය වන්නේ

(1) 1929 (2) 1990 (3) 119 (4) 1919 (........)

(04) සහජීවන ගුණාංග පුරුදු පුහුණු නොකිරීමෙන් මුහුණ පෑමට සිදුවන අයහපත් ප්‍රතිඵල පිළිබඳව කියැවෙන ''මල්ලියේ නරක මිතුරන් පිළිගන්ට එපා'' යන ගීතය රචනා කරන ලද්දේ කවුරුන් විසින් ද?

(1) විශාරද සනත් නන්දසිරි (2) විශාරද සුනිල් එදිරිසිංහ

(3) මහාචාර්ය සුනිල් ආරියරත්න (4) විශාරද නන්දා මාලනී (........)

(05) ශ්‍රී ලංකාවේ සමූපකාර ව්‍යාපාරය ප්‍රථමයෙන්ම ආරම්භ වූයේ

(1) විවිධ සේවා සමූපකාර සමිති ලෙසිනි (2) ධීවර සමූපකාර සමිති ලෙසිනි

(3) ජෛව සම්පත් සමූපකාර සමිති ලෙසිනි (4) සමූපකාර ණය දෙන සමිති ලෙසිනි (........)

(06) යහජීවනයෙන් කටයුතු කිරීම තුලින් ලැබෙන ප්‍රතිලාභයක් **නොවන්නේ**

(1) අන් අයගේ අයිතිවාසිකම් ආරක්ෂා වීම (2) සමාජ සුරක්ෂිතතාවය තහවුරු වීම

(3) බිය සැක සහිතව ජීවත් වීමට සිදු වීම (4) ධර්මිෂ්ඨ නිවහල් සමාජයක් ගොඩ නැගීම (........)

(07) ආර්ථික මූල මත ඇති වූ ගැටුමක් ලෙස දැක්විය හැක්කේ මින් කවරක් ද?

(1) ඊශ්‍රායල, පලස්තීන ගැටුම (2) ඉරාකය හා ක්වේටය අතර ගැටුම

(3) අයර්ලන්ත යුද්ධය (4) කුරුස යුද්ධය (........)

(08) ගැටුම් විසඳීම සඳහා යොදා ගනු ලබන සමථකරණයේ ප්‍රධාන ලක්ෂණයක් වන්නේ

(1) සේවක සේව්‍ය යන දෙපාර්ශවයෙන් යුක්ත වීම (2) නීතියේ ප්‍රතිපාදන අනුව තීරණ ලබාදීම

(3) විධිමත් ලෙස නඩු අසා විසඳුම් ලබාදීම (4) සාකච්ඡා කර විසඳුමක් ලබා ගැනීමට යොමු කරවීම

(........)

- **9 - 10 ප්‍රශ්න සඳහා පහත ප්‍රකාශ සැලකිල්ලට ගන්න**

A - ආයතනයේ සෑම නිලයකටම ගරු කිරීම

B - ආයතනයේ අරමුණු ඉටුකර දිය හැකි වීම

C - උපරිම කැපවීමෙන් යුතුව කටයුතු කිරීම

D - සමිති සමාගම්වලට එක් වී කටයුතු කිරීම

(09) කාල කළමනාකරණයේ වැදගත්කම දැක්වෙන ප්‍රකාශය ඇතුළත් පිළිතුර කුමක් ද?

(1) A ය (2) B ය (3) C ය (4) D ය (........)

(10) යහපත් පෞද්ගලික හැසිරීමක ලක්ෂණ දැක්වෙන ප්‍රකාශ වන්නේ

(1) A හා B ය (2) B හා C ය (3) C හා D ය (4) A හා C ය (........)

(11) ශ්‍රී ලංකාවේ යුධ හමුදාවේ ආදර්ශ පාඨය කුමක් ද?

(1) ''රට වට බැඳි රන්වැට'' (2) ''සුරකිමු ලකඹර''

(3) ''ධම්මෝ හවේ රක්ඛති ධම්මචාරී'' (4) පීතෘ භූමිය සඳහා (........)

(12) ශ්‍රී ලංකාවේ ප්‍රධාන නීති නිලධාරියා වන්නේ

(1) ජනාධිපති තුමා ය (2) නීතිපති තුමා ය (3) පොලිස්පති තුමා ය (4) අගමැති තුමා ය (........)

(13) තාක්ෂණික වෙනස්වීම් නිසා ඇතිවන හිතකර බලපෑම මින් කවරක් ද?

(1) ඵලදායීතාව වැඩි වීම (2) සමාජය සංකීර්ණ වීම

(3) මිනිස් අවශ්‍යතා සංකීර්ණ වීම (4) මිනිසුන් යාන්ත්‍රීකරණය වීම (........)

(14) ඍජු ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක වූ ඇතැන්ස් පෞර රාජ්‍යයේ ප්‍රධාන පාලන ආයතනය වූයේ

(1) නගර සභාවයි (2) මහා සභාවයි (3) පුරවැසි සභාවයි (4) සෙනෙට් සභාවයි (........)

(15) ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන අතුරෙන් මහ නගර සභාවක් ක්‍රියාත්මක වන දිස්ත්‍රික්ක ඇතුළත් පිළිතුර තෝරන්න

(1) මහනුවර , යාපනය හා ගාල්ල (2) කොළඹ , ත්‍රිකුණාමලය හා කෑගල්ල

(3) මාතර , කොළඹ හා පොළොන්නරුව (4) හම්බන්තොට , මොනරාගල හා පුත්තලම (........)

(ලකුණු 2×15=30)

- **16 - 20 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර වරහන් තුලින් තෝරා හිස්තැන මත ලියන්න**

(16) සීමිත සම්පත් උපරිම අන්දමින් ප්‍රයෝජනයට ගැනීම ................................................ යි

(17) විද්‍යාත්මක ක්‍රමවේද අනුගමනය කරමින් ගැටලුවක් පිළිබඳව විසඳුම් සොයා ගැනීමට කෙරෙන අධ්‍යයනය .................................................. යනුවෙන් හැඳින්විය හැකිය

(18) රටක යුක්තිය පසිඳලන ආයතනය .................................................. යි

(19) ආර්ථිකයක නිෂ්පාදනය කරන භාණ්ඩ හා සේවා යොදාගෙන මිනිස් අවශ්‍යතා ඉටුකර ගැනීම .............................................. යි

(20) ශ්‍රී ලාංකිකයන්ට සර්වජන ඡන්ද බලය ලබා දුන්නේ .................................................. ආණ්ඩු ක්‍රමයෙනි

(ගවේෂණය , කාර්යක්ෂමතාවය , පර්යේෂණය , පරිභෝජනය , අධිකරණය , ඩොනමෝර් , ඵලදායිතාව , සෝල්බරි)

(ලකුණු 2×5=10)

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2020

## 09 ශ්‍රේණිය

## පුරවැසි අධ්‍යාපනය

II කොටස

- x පළමුවන ප්‍රශ්නය අනිවාර්යය වේ
- x පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න

(01) 1) ශ්‍රී ලංකාවේ වර්තමානයේ ක්‍රියාත්මක වන මැතිවරණ දෙකක් නම් කරන්න

2) යහපත් පුරවැසියකු විසින් ප්‍රගුණ කල යුතු යහජීවන ගුණාංග දෙකක් නම් කරන්න

3) අධ්‍යාපනික කටයුතු සඳහා වර්තමානයේ භාවිතයට ගන්නා නවීන තාක්ෂණික ක්‍රමවේද දෙකක් නම් කරන්න

4) සම්මුඛ පරීක්ෂණයකට ඉදිරිපත් වීමේ දී ''කථනය හා බස හැසිරවීම'' පිළිබඳ සැලකිලිමත්විය යුතු කරුණු දෙකක් ඉදිරිපත් කරන්න

5) ගැටුම් ඇතිවීමට බලපාන හේතු දෙකක් ලියන්න

(ලකුණු 4×5=20)

(02) ''සෑම සමාජයක්ම නීතියට අනුව පාලනය විය යුතු වේ''

1) නීතියේ මූලාශ්‍ර දෙකක් නම් කරන්න (ලකුණු 02)

2) අපරාධ නීතිය යටතට ගැනෙන වැරදි තුනක් සඳහන් කරන්න (ලකුණු 03)

3) A -නීතිය බලාත්මක කරන ආයතනයක් ලෙස ශ්‍රී ලංකා පොලීසිය විසින් කොවිඩ් 19 වසංගතය මර්දනය වැනි හදිසි ආපදා කටයුතු කිරීමේ දී, පුරවැසියෙකු ලෙස ඔබට ඉටුකල හැකි යුතුකම් දෙකක් සඳහන් කරන්න

B -ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න (ලකුණු 05)

(03) ''වර්තමානයේ විවිධ කටයුතු සඳහා තාක්ෂණය භාවිතයට ගනියි''

1) යෝග්‍ය තාක්ෂණය යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 02)

2) යෝග්‍ය තාක්ෂණය භාවිතය නිසා අත්වන ප්‍රතිලාභ තුනක් සඳහන් කරන්න (ලකුණු 03)

3) කෘෂි කාර්මික කටයුතු වල දී තාක්ෂණය භාවිතයට ගන්නා අවස්ථා තුනක් සඳහන් කර ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න (ලකුණු 05)

(04) ''ජීවිතයේ විවිධ අවශ්‍යතා ඉටුකර ගැනීමට අදාළ සේවා රැසක් සමූපකාර ව්‍යාපාරය ඉටු කරයි''

1) සමූපකාර ව්‍යාපාරයේ පියා ලෙස සැලකෙන්නේ කවරෙක් ද? (ලකුණු 02)

2) විවිධ සේවා සමූපකාර සමිති මගින් ඉටුවන සේවාවන් තුනක් සඳහන් කරන්න (ලකුණු 03)

3) පාසල් සමූපකාර සමිතියකින් ඔබට අත්වන ප්‍රයෝජන තුනක් සඳහන් කර ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න (ලකුණු 05)

(05) ''මහජනතාවගේ බහුතර කැමැත්ත මත ගොඩ නගා ගනු ලබන පාලන ක්‍රමය ප්‍රජාතන්ත්‍රවාදය යි''

1) ඍජු ප්‍රජාතන්ත්‍රවාදය වර්තමානයේ ක්‍රියාත්මක කිරීමේදී මතුවන ගැටලු දෙකක් ලියන්න (ලකුණු 02)

2) ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක ලක්ෂණ තුනක් සඳහන් කරන්න (ලකුණු 03)

3) ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක,

A - ඡන්ද බලයේ වැදගත්කම දැක්වීමට කරුණු දෙකක් ද

B - මැතිවරණ සම්බන්ධ පුරවැසි යුතුකම් තුනක් ද සඳහන් කරන්න (ලකුණු 05)

(06) ''ප්‍රාදේශීය අවශ්‍යතා වඩාත් ඵලදායිව හා කාර්යක්ෂමතාවයකින් යුතුව ඉටු කිරීමට පළාත් පාලන ආයතන ක්‍රියා කරයි''

1) පළාත් පාලන ආයතන සීමා නිර්ණයේ දී සැලකිල්ලට ගනු ලබන නිර්ණායක දෙකක් ලියන්න (ලකුණු 02)

2) පළාත් පාලන ආයතනයකට මූල්‍ය සම්පත් උපයාගත හැකි ක්‍රම තුනක් සඳහන් කරන්න (ලකුණු 03)

3) පළාත් පාලන ආයතනයක කසල බැහැර කිරීම සඳහා සකස් කරන සැලසුමකට ඇතුළත් කිරීම සඳහා ඔබට යෝජනා කලහැකි ක්‍රියාකාරකම් පහක් සඳහන් කරන්න (ලකුණු 05)

(07) ''වැඩ ලෝකය විවිධ වූ වෘත්තීන් / රැකියා වලින් විචිත්‍රවත් වූවකි''

1) වර්තමානයේ දී ශ්‍රී ලංකාවේ පවත්වා ගෙන යනු ලබන වෘත්තීය පුහුණු ආයතන දෙකක් නම් කරන්න (ලකුණු 02)

2) රැකියා දැන්වීමක් සඳහා ප්‍රතිචාර දැක්විය හැකි ප්‍රධාන ක්‍රම තුන සඳහන් කරන්න (ලකුණු 03)

3) වෘත්තීය ජීවිතය හා පෞද්ගලික ජීවිතය සමබරව පවත්වාගෙන යාමට කටයුතු කල යුතු ආකාරය පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න (ලකුණු 05)